**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2017/2018**

**SOC 3160 – ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා සංවර්ධනය**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. "ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සංවර්ධනය" (Gender and Development) සහ "සංවර්ධනය තුළ ස්ත්‍රිය" (Women in Development) යන ප්‍රවේශ දෙක අතර වෙනස පැහැදිලි කරන්න.

2. ගෝලීය ආර්ථිකය තුළ ශ්‍රම සංක්‍රමණය ස්ත්‍රීන්ගේ අනන්‍යතාව සහ භූමිකා මත කර ඇති බලපෑම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

3. යුධමය වාතාවරණයක් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය ප්‍රකාශයට පත් වන ආකාරය පැහැදිලි කරන්න.

4. 'එස්කෝබාර් සංවර්ධනය පිළිබඳ කථිකාව විවේචනය කරයි.' සාකච්ඡා කරන්න.

5. Iffat Fathima ගේ *Lanka: the other side of war and peace* සිනමා කෘතිය ආශ්‍රයෙන් දේශපාලන ප්‍රචණ්ඩත්වය ලාංකික ස්ත්‍රීන් කෙරෙහි සිදු කර ඇති බලපෑම විචාර පූර්වකව සාකච්ඡා කරන්න.

6. යම් රටක ජනතාවගේ සෞඛ්‍යය පිළිබඳ අධ්‍යයනය සඳහා ජීව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක ප්‍රවේශ පමණක් ප්‍රමාණවත් නොවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කථිකාවද එහිදී අත්‍යවශ්‍ය ප්‍රවේශයක් වශයෙන් සැලකිය යුතුය. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? විචාරාත්මකව විමසන්න.

***************